# බෞද්ධ චින්තන විප්ලවය

ලෝකයේ සිදු වී ඇති චින්තන විප්ලව අතර භාරතයේ ආර්යයන්ගේ පැමිණීමෙන් පසුව සිදු වී ඇති විප්ලවය ඉතා වැදගත් වෙයි. ආර්යයන් පැමිණීමට පෙර භාරතයේ ද ඒ සමයේ චීනයේ ද විවිධ චින්තන තිබූ බව පැහැදිලි ය. චීනයේ තිබුව චින්තනය ගැන සෑහෙන යමක් කිව හැකි වුව ද, භාරතයේ එකල තිබූ චින්තනය ගැන කිව හැක්කේ අනුමානයෙනි. එයට හේතුව චීන චින්තනය (හෝ චින්තන) භාරතීය චින්තන තරම් වෙනස් නොවීම ය. චීන චින්තනය යම් තරමකට හෝ වෙනස් වී ඇත්තේ බුදු දහම එරටට හඳුන්වා දීමෙන් පසුව ය. එහෙත් එහි දී වුවත් බුදු දහමෙහි ඇති එක් ප්‍රධාන ගුණයක් වූ ඒ ඒ රටේ සංස්කෘතිය තුළට බෞද්ධ වත් පිළිවෙත් අවශෝෂණය වීමට ඉඩ දීම තුළ චීන චින්තනය මහා පරිමාණයෙන් වෙනස් නොවිණි. චීනය ආර්ය ආක්‍රමණයකට ගොදුරු නොවීම තුළ චීන චින්තනයට භාරතීය චින්තනයට මෙන් නොව යම් ස්ථාවරත්වයක් ලැබිණි. ආර්ය ආක්‍රමණයත් සමග භාරතීය චින්තනය විශාල වශයෙන් වෙනස්කම්වලට භාජනය විණි යැයි සිතා ගත හැකි ය.

පැරණි ආසියාවේ තිබූ චින්තන ගැන හැදෑරීම සඳහා වැදගත් පොතක් දැන් සිංහලෙන් පළ වී ඇත. හජිමෙ නකමුර විද්වතාණන් විසින් ලියන ලදුව මහාචාර්ය පී. බී. මීගස්කුඹුර මහතා විසින් පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි ලෙස (වේස් ඔෆ් තින්කින් ඔෆ් ඊස්ටන් පීපල්ස්) සිංහලට පරිවර්තනය කෙරී ඇති මෙ පොත විසිදුණු ප්‍රකාශණයක් ලෙස එළි දැක්වී ඇත. භාරතයේ චීනයේ තිබ්බතයේ හා ජපානයේ චින්තන විධි ගැන පොතෙහි විස්තර කෙරෙයි. මෙ පොතෙහි චින්තනය යන්න යෙදෙන්නේ ඉංගිරිසියෙන් තින්කින් යන වචනය වෙනුවෙනි. එය මෙ ලිපි පෙළෙහි චින්තනය යන වචනය යෙදෙන අර්ථයට වඩා තරමක් වෙනස් වුව ද, එහි සඳහන් විස්තර වැදගත් වෙයි. ලිපි පෙළෙහි චින්තනය යන වචනය යෙදෙන්නේ හුදෙක් සිතීමට හෝ සිතන ආකාරයකට වඩා සිතීමට, දැනුම් නිර්මාණයට ආදියට පදනම්වන ආකල්ප, ඥාන විභාග සමන්විත වූ පසුබිමකට ය. කෙසේ හෝ වේවා ඒ පොත ඇසුරින් ලිපි පෙළෙහි දැක්වෙන චින්තන ගැන ද අවබෝධයක් ලබා ගැනීම අසීරු නොවේ.

සිදුහත් කුමරු උපන්නේ අද නේපාලය නමින් හැඳින්වෙන ප්‍රදේශයෙහි ය. නේපාලය අද හින්දු රටකි. එදා කිඹුල්වත් නුවර දෙව්දහ නුවර ආදී ශාක්‍ය නගර චීන චින්තනයෙන් යම් ආභාසයක් නොලැබී යැයි කිව හැකි නොවේ. සුදොවුන් රජතුමා වැන්නන් ඒ ඒ ශාක්‍ය නගරවල රජවරුන්ට වඩා ප්‍රාදේශීය ප්‍රධානීන් වන්නට ඇතැයි සිතිය හැකි ය. ආර්යයන් මුලින් ම පැමිණියේ භාරතයේ වයඹ දෙසට ය. එතැනින් ක්‍රමයෙන් භාරතයේ නැගෙනහිරටත් දකුණටත් ආර්ය ශිෂ්ටාචාරය ගලා ගියේ ය. කලින් ද සඳහන් කර ඇති පරිදි ඉතිහාසඥයන් පවසන්නේ ආර්ය ශිෂ්ටාචාරය භාරතය පුරා පැතිරී ගියේ පුද්ගලයන් සංක්‍රමණය වීමට වඩා සංස්කෘතිය සංක්‍රමණය වීම මගිනි. නේපාලයට ආර්ය සංස්කෘතිය ගලා යෑමට තරමක් කාලයක් ගතවන බවත් එබැවින් භාරතයේ බොහෝ ප්‍රදේශවලට වඩා අද නේපාලය නමින් හැඳින්වෙන ප්‍රදේශයේ එදා ආර්ය බලපෑම අඩු වූ බවත් සිතා ගැනීම අපහසු නොවේ.

මෙහි දී කිවයුතු තවත් කරුණක් වෙයි. බුදු දහම වඩාත්ම ප්‍රචලිත වූයේ භාරතයේ මධ්‍ය දේශය නමින් හැඳින්වෙන ප්‍රදේශයේ ය. මධ්‍ය දේශය භාරතයේ නැගෙනහිරට බරව පිහිටයි. එමෙන් ම පසු කලෙක බුදු දහම පැතිරී ගියේ භාරතයේ දකුණු දෙස හා ලංකාවෙහි ය. ඉන් අනතුරුව බුදු දහම පැතිරී ගියේ චීනය, තිබ්බතය, ජපානය, කොරියාව, වියට්නාමය  වැනි රටවලත්, මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය වැනි රටවලත් ය. පළමු කී රටවල මහායාන බුදු දහම ද දෙවනු කී රටවල ථෙරවාදී බුදු දහම ද ප්‍රධාන වශයෙන් දැකගත හැකි ය. කලක් ගතවීමෙන් පසුව භාරතයෙන් බුදු දහම සම්පූර්ණයෙන් මෙන් නැති වී ගියේ ය. එය ඉතිරි වූයේ චීනය ආදී රටවලත් මියන්මාරය ආදී රටවලත් ය. ඒ රටවල මිනිස්සු සාමාන්‍යයෙන්  කහ පැහැයෙන් යුක්ත වෙති. ඇතැම් වර්ගීකරණයකට අනුව ඒ රටවල ජනයා මොංගෝලියන් යන පළල් නමින් හැඳින්වෙයි. මෙ වර්ගීකරණය අද බොහෝ දුරට ගත්කල නොපිළිගැණුන ද, බුදු දහම එසේ ඒ සංස්කෘතීන්හි හා මොංගෝලියන් යනුවෙන් කිසිසේත් හැඳින්විය නොහැකි සිංහල මිනිසුන්ගේ සංස්කෘතියෙහි පමණක් නොනැසී පැවතීමට හේතුව කුමක් ද යන්න අප ලුහුඬින් හෝ සාකච්ඡා කළ යුතු ය. මොංගෝලියන් යනුවෙන් හැඳින්විය නොහැකි සංස්කෘතියක ථෙරවාදය හෝ මහායානය හෝ වෙනත් ආකාරයක බුදු දහමක් පැවතිණි නම් ඒ අපේ රටේ සිංහල මිනිසුන් අතර පමණක් බව කිසිසේත්ම අමතක නොකළ යුතු ය. බුදු දහම වඩාත් අදාළ වන්නේ මොංගෝලියානු යැයි කලක් හැඳින්වුණු මිනිසුන්ගේ සංස්කෘතියක ද? සිදුහත් කුමරු උපන්නේ ද

© Prof. Nalin De Silva

වත්මන් නේපාලය නමින් හැඳින්වෙන රටේ බවත් ඒ රට අද මිනිසුන්ගේ හැඩ රුව අනුව කෙසේ වෙතත් සංස්කෘතික වශයෙන් හින්දු බවත් එය වත්මන් බටහිර අධිපතිවාදී චින්තනය පැතිර යෑමට පෙර භාරතීය වෛදික චින්තනයට යට වූ බවත් මෙහි දී අපට අදාළ වන කරුණු ය.

බුදු දහම භාරතයෙන් නැති වී යෑමට විවිධ හේතු දක්වනවා විය හැකි ය. මහායාන බුදු දහමෙහි ව්‍යාප්තිය, එය පසු කලෙක සංකරාචාර්යයන් අතින් පෝෂණය වූ අද්වෛත වේදාන්තයට යට වීම, මුස්ලිම් ආක්‍රමණය ආදිය යම් ආකාරයකට එහි දී බල පාන්නට ඇත. ඒ පිළිබඳ සැකයක් නැත. එහෙත් මෙහි දී අප සලකා බැලිය යුතු ඉතා වැදගත් කරුණක් වෙයි. එනම් භාරතීය චින්තනය බුද්ධ කාලයේ සිට කෙසේ වෙනස් විණි ද යන්න හා ලංකාවේ බුදු දහම ථෙරවාද ස්වරූපයෙන් රැකෙන්නට හේතුව (හේතු) කුමක් ද යන්න ය. අපේ පැරණි බුද්ධිමතුන් (එකල අපට බුද්ධිමත්තු වූහ) බුදු දහම පන්දහසක් කල් ලංකාවේ නොනැසී පවතින බව විශ්වාස කෙළේ කරුණු නැතිව නොවේ. ඔවුන් පොදු ජනයා උදෙසා කිනම් කරුණක් එයට සාක්ෂි වශයෙන් කැදෙවුව ද (බුදුන් වහන්සේ ලංකාවේ බුදු දහම අවුරුදු පන්සීයක් පවතින්නේ යැයි දේශනා කර ඇතැයි කියන දේ ආදිය) ඔවුන්ට භාරතයේ වෙමින් පැවති දේ ගැන අවබෝධයක් තිබෙන්නට ඇත. චින්තනය යන සංකල්පය එදා වෙනත් ආකාරයකින් හෝ ලංකාවේ තිබුණ ද නැත් ද, මහායානයට යටවීම යනු අවසාන විග්‍රහයෙහි දී වෛදික චින්තනයට යටවීමක් ලෙස අපේ පැරණි භික්ෂූන් වහන්සේ ද, ගිහි බුද්ධිමතුන් ද තේරුම් ගත්තාට සැකයක් නැත. අප අවසානයේ දී වෛදික චින්තනයට යට නොවීමට ප්‍රධාන හේතුව බෞද්ධ භික්ෂූන් වහන්සේලා එකල අප්‍රතිහත ධෛර්යයෙන් මහායානය පැතිර යා නොදී අපේ චින්තනය ආරක්ෂා කිරීම බව පැහැදිලි ය. අප අපේ විද්‍යා ප්‍රවාද ගොඩ නගන්නේ නම් අපට අනුරාධපුර සංස්කෘතියට න්‍යායාත්මක ව හෝ සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳ ව සුළු අවබෝධයක් හෝ තිබිය යුතු ය.  එහෙත් එයට කලින් නැවතත් භාරතයට යමු.

භාරතයට පැමිණි ආර්යයන් හා එවකට එහි සිටි අනාර්යයන් මිශ්‍ර වී (ජෛවීය වශයෙන් පමණක් නොව එයට වඩා වැදගත් ලෙස සංස්කෘතික වශයෙන්) ගොඩ නගන ලද වෛදික සංස්කෘතිය හා අදාළ වෛදික චින්තනය භාරතයේ වයඹ දෙස සිට නැගෙනහිරට හා දකුණට ගලා යන්නට සෑහෙන කලක් ගත වන්නට ඇත. සිදුහත් කුමරු වෛදික ශිල්ප ශාස්ත්‍ර හදාරන්නට ඇති වුව ද එතුමාට අනාර්ය චින්තනයක් ශාක්‍ය සංස්කෘතිය තුළින් ම හිමි වන්නට ඇත. ශ්‍රමණ තවුස් සම්ප්‍රදාය මාවත ලෙස ගත් සිදුහත් තවුසාට ආත්මය පිළිබඳ සංකල්පය පැරණි සාංඛ්‍ය දර්ශනයෙන් මෙන් ම ආළාර කාළාම, උද්දකාරාම පුත්ත මෙන් ම පස්වග තවුසන්ගෙන් ද ලැබුණාට සැකයක් නැත. ජීවාත්මයක් පිළිබඳ අදහස පැරණි අනාර්ය චින්තනය මත පදනම් ව ගොඩ නැගුණක් විය යුතු ය. එය පරමාත්මය සහිත බ්‍රහ්මන් දක්වා වර්ධනය වන්නට ඇත්තේ වෛදික චින්තනයෙහි ය.

සිදුහත් තවුසාණන්ට ලෞකික වශයෙන් ගත් කල එක්විට විප්ලව දෙකක් කිරීමට සිදු විය. එකක් තමා විසින් තෝරා ගන්නා ලද ශ්‍රමණ සම්ප්‍රදායෙහි ය. අනෙක වෛදික චින්තනයට එරෙහිව ය. ලෝකෝත්තර වශයෙන් නිවන් අවබෝධ කර ගන්නා අතර ම මේ ලෞකික චින්තන විප්ලවය ද වූ බව අප අමතක නොකළ යුතු ය. සිදුහත් තවුසාණන්ට එවැනි විප්ලව කිරීමෙහි අවශ්‍යතාවයක් තිබිණි යැයි මෙයින් නොකියැවෙයි. එහෙත් ඒ විප්ලව ද සිදු විය.

පළමුවෙන් ම ඇත්තේ ශ්‍රමණ සම්ප්‍රදාය තුළ ම සිදු වූ විප්ලවය ය. සිදුහත් තවුසාණන් ශ්‍රමණ සම්ප්‍රදාය තුළ නෙව සඤ්ඤා නා සඤ්ඤා ධ්‍යාන අවස්ථාවට පත් ව තිබුණි. කෙළෙස් තැවීම, සිරුරට දුක් දීම ආදී වශයෙන් ශ්‍රමණ සම්ප්‍රදාය තුළ පැවති සියල්ල බෝසතාණන් වහන්සේ පුරුදු කර තිබුණි. එහෙත් ඒ මගින් යා හැක්කේ ධ්‍යාන උපදවා ගැනීම දක්වා බවත් එය විමුක්තිය නොවන බවත් උන්වහන්සේ දැන සිටියහ. උන්වහන්සේට වෙනත් මගක් අවශ්‍ය විය. ඒ මග ගත් වහාම පස්වග තවුසෝ උන්වහන්සේට විරුද්ධ වූහ. ඔවුහු උන්වහන්සේ අත් හැරියහ.

මේ මග අද මධ්‍යම ප්‍රතිපදාව ලෙස හැඳින්වෙයි. මෙය හුදෙක් අවසන් වශයෙන් කාම සුඛල්ලිකානු යෝගය හා අත්ථකිලමතානු යෝගය අතර වූ මැදි මාවතක් නොවී ය. එහි චින්තන විප්ලවයක් ද වෙයි. මධ්‍යම ප්‍රතිපදාව යනු යම් අන්ත දෙකක මැද ගැනීම නොව අන්ත දෙක ම නොගැනීම ය.  කාම සුඛල්ලිකානු යෝගය මෙන් ම අත්ථකිලමතානු යෝගය ද ප්‍රතික්ෂේප කෙරිණි. එපමණක් නොවේ. ශාස්වතවාදය මෙන් ම උච්ඡේදවාදය ද ප්‍රතික්ෂේප කෙරිණි. දිගින් දිගට ම සන්තතික ව පවත්නා ආත්මයක් (පරමාත්මයක් මෙන් ම ජීවාත්මයක්) පිළිබඳ අදහස මෙන් ම පවත්නා

© Prof. Nalin De Silva

දෙයක් උන්හිටි ගමන් මරණයෙන් හෝ වෙනත් අයුරකින් හෝ නැතිවන්නේ ය, බිඳී යන්නේ ය යන අදහස ද ප්‍රතික්ෂේප කෙරිණි. බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබූහ. නිවන් අවබෝධ කල හ. එහෙත් මේ එකක් වත් වචනයෙන් කියා පෑමට බුදුන් වහන්සේ උත්සාහ නොකළහ. එසේ වචනයෙන් විස්තර නොකළ ඇතැම් දෑ පසු කාලීන භික්ෂූන් වහන්සේ, විශේෂයෙන් ම මාධ්‍යමිකයන් හා ඉන් පසුව පැමිණි විවිධ මහායාන ගුරුකුලවල භික්ෂූන් වහන්සේ වචනයෙන් විස්තර කිරීමට උත්සාහ ගත්හ. මේ ව්‍යායාමය කෙළවර වූයේ මහායානිකයන් වෛදික චින්තනය මත පදනම් වූ න්‍යාය උපයෝගී කර ගෙන අවසානයේ දී වෛදික චින්තනයට යට වීමෙනි. බුදුන් වහන්සේ අවබෝධ කළ නිවන අතක්කාවචර විය. එය තර්කයකට හසු වන්නක් නොවේ. බුදුන් වහන්සේ එයට තර්කානුකූලභාවයක් පැළඳවීමට ද කටයුතු නොකළහ. මහායානිකයෝ එවැනි නිවනක් තර්කානුකූල කිරීමට තැත් කළහ. එපමණක් නොවේ. ඒ තර්ක ගොඩ නගනු ලැබුයේ වෛදික චින්තනය මත නිර්මාණය වූ න්‍යාය භාවිතා කිරීමෙනි.

බුදුන් වහන්සේගේ විප්ලව දෙකින් එකක් ශ්‍රමණ සම්ප්‍රදායට එරෙහි ව කරන ලද්දක් විය. අනෙක වෛදික සම්ප්‍රදායට එරෙහිව කරන ලද්දකි. මා නැවතත් අවධාරණය කළ යුත්තේ බුදුන් වහන්සේ එලෙස වුවමනාවෙන් ම ලෞකික වශයෙන් විප්ලව නොකළ බව ය. උන්වහන්සේට අවශ්‍ය වූයේ සත්ත්වයා සසර දුකින් මුදවා ගැනීම ය. කෙසේ වෙතත් ආත්මයක් නැතැයි දේශනා කිරීමෙන් උන්වහන්සේ අති ප්‍රබල විප්ලවයක් ශ්‍රමණ සම්ප්‍රදාය තුළ මෙන් ම ඉන් පිටත වූ වෛදික චින්තනයෙහිත් සිදු කළහ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන්න හුදු ලෝකෝත්තර විප්ලවයකට තුඩු දෙන්නක් පමණක් නොවී ය. එය ලෞකික වශයෙන් ගත් කල ද චින්තන විප්ලවයක් සිදු කෙළේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva